**කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2017**

-----------------------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17 (2) නියමය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 49 (1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ගිණුම් හා වැටුප් පරිගණක පද්ධතියක් සැකසීම හා ආරක්ෂක සේවා වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති පිළිවෙලින් රු.95,250 ක් හා රු.758,287 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව වත්කම් අයිතම තුනක ක්ෂය වටිනාකම රු.242,758 ක් වැඩියෙන් හා වත්කම් අයිතම තුනක ක්ෂය වටිනාකම රු.729,183 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සහ දේපල පිරියත හා උපකරණවල ශුද්ධ අගය රු.486,425 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ගොඩනැගිලි සංවර්ධනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.9,165,000 ක අත්තිකාරම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණු නමුත් ඉදිකිරීම්වල කළවැඩ වටිනාකම ගණනය කිරීමකින් තොරව සම්පූර්ණයෙන් අත්තිකාරම ප්‍රාග්ධනිත කර තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 09 වගන්තිය | නව වැටුප් චක්‍රලේඛය පරිදි සකස් කරන ලද වැටුප් පදනම් කරගෙන පාරිතෝෂික ගණනය කිරීම සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,232,107 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,912,306 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,144,413 ක පිරිහීමක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු.5,049,950 කින් වැඩිවී තිබුණද කාර්ය මණ්ඩල පිරිවැය රු.4,739,457 කින් හා සේවා වියදම් රු.5,103,643 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වසර 02 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී රු.667,134 ක ඌනතාවයක් ඇති වී තිබුණද 2016 වර්ෂයේදී රු.1,912,306 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු.2,232,107 ක ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2015 වර්ෂයේදී රු.44,459,974 ක්වූ විද්‍යායතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.61,198,824 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 සැලසුම් කිරීම

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද ඒ සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය ආරම්භයේදී වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2017 ඔක්තෝබර් 11 දින දීය.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-----------------------------------

2016 හා 2017 වසර වලදී පාඨමාලා 08 ක් වෙනුවෙන් පවත්වන ලද විභාග 03 කට පෙනී සිටි සිසුන් 563 කගෙන් සියයට 04 සිට සියයට 68 දක්වා වූ පරාසයක සිසුන් ප්‍රමාණයක් පමණක් සියලුම විෂයයන් සමත් වී තිබුණි. තවද ඉහත පාඨමාලා තුල ඇතුලත් 2016 ජූලි මාසයේදී පවත්වන ලද සංචාරක හා සංචරණ කළමනාකරණ පාඨමාලාවේ පදනම් පරීක්ෂණයට පෙනී සිටි සිසුන් 26 දෙනාම සියලුම විෂයයන් අසමත් වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනයට ආරක්ෂක සේවය සඳහා ලංසු කැඳවීමේදී නිවැරදි පිරිවිතරයන් හා දිවා රාත්‍රී සේවා මුර සඳහා අවශ්‍ය ආරක්ෂක නිලධාරීන් ගණන ඇගයීම් කමිටුව විසින් නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් ගිවිසුම් මුදල ඉක්මවා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් වන විට රු.585,612 ක් ගෙවීම් කර තිබූ අතර තවදුරටත් රු.758,287 ක් ගෙවිය යුතුව තිබුණි.

(ආ) විද්‍යායතනය පිහිටි හෙක්ටයාර 5.4 ක භූමි ප්‍රමාණය විධිමත්ව පවරාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.9,165,000 ක්වූ ඉදිකිරීම් සහ නවීකරණය කිරීම් සිදුකර තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

ගිණුම් සහ වැටුප් ගෙවීම් පිළිබඳ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය යටතේ ආයතන 7 කින් මිල ගණන් කැඳවා තිබුණද මිල ගණන් ලැබී තිබුණේ ආයතන දෙකකින් පමණි. එයින්ද පිළිගතහැකි හේතු ඉදිරිපත් කිරීමකින් තොරව අවම මිල තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර රු.539,750 කට මිලදී ගැනීම සිදුකර තිබුණි.

**4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෝටර්රථ තාක්ෂණ පාඨමාලාවේ වීල් එලයිමන්ට් අංශය සඳහා 2015 මාර්තු 24 දින ලැබී තිබූ රු.1,435,000 ක් වූ උපකරණයේ ක්‍රියාකාරී දෝෂයක් හේතුවෙන් එම උපකරණය වර්ෂ 03 ක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පවතින බව විගණන දිනය වූ 2018 මාර්තු 28 දිනදී නිරීක්ෂණය විය. අදාල නියෝජිත ආයතනය විසින් පරීක්ෂා කලද භාවිතා කල හැකි තත්ත්වයට පත් කිරීමට නොහැකි වී තිබුණි. අදාල උපකරණ නිෂ්ක්‍රීයව පැවතීම සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුවීම් කෙරෙහි බලපා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ඉදිකිරීම් තාක්ෂණ විද්‍යාගාරයට 2015 ජනවාරි 01 දින ලැබී තිබූ පිරිවැය රු.312,000 ක් වූ Say bolt viscometer Apparatus උපකරණය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සිසුන් සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව පෞද්ගලික ආයතනවලින් ලබාගැනීමට සිදුවී තිබුණු බව විගණන දිනය වූ 2018 මාර්තු 28 දිනදී නිරීක්ෂණය විය.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශකවරුන් හය දෙනෙකු හා ප්‍රදර්ශකවරුන් දෙදෙනෙකු, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කළමනාකාර සහකාරවරුන් දෙදෙනෙකුද, නඩත්තු ශිල්පී එක් අයෙකු හා රසායනාගාර සහායක දෙදෙනෙකු පුරප්පාඩුව පැවතුණි. තවද, විද්‍යායතනය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ගොවි හා යන්ත්‍රෝපකරණ පාඨමාලාව හා ඉදිකිරීම් තාක්ෂණවේද පාඨමාලාව සඳහා පිළිවෙලින් 2016 අප්‍රේල් හා නොවැම්බර් සිට ප්‍රදර්ශකවරුන් නොමැතිවීම හේතුවෙන් එම පාඨමාලා නියමිත පරිදි පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

**5. තිරසර සංවර්ධනය**

---

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම**

---

2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව විද්‍යායතනය විසින් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබූ අතර ඊට අදාල පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමේදී පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම යටතේ වූ ඉලක්ක හඳුනාගත යුතු වුවත් හඳුනාගෙන තිබුණේ දරිද්‍රතාවය පිටුදැකීමේ අරමුණ විය. තවද හඳුනාගත් අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබූ අතර පාදක වර්ෂ හා පාදක දත්තද හඳුනාගෙන නොතිබුණි.

(ආ) සුදුසුකම්ලත් මානව සම්පත් හා භෞතික සම්පත්වල හිඟකම හේතුවෙන් අදාල අරමුණු හා ඉලක්ක ලගාකර ගැනීම සඳහා වූ ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුල විද්‍යායතනය විසින් ඊට සම්බන්ධිත පාර්ශවයන් හඳුනාගෙන දැනුවත් කිරීමේ වැඩ සටහන් හෝ චක්‍රලේඛ මගින් දැනුවත් කිරීම් සිදු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

----------------------

විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009 (1) මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 ඡේදය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වුවත්, විශ්වවිද්‍යාල විද්‍යායතනය ආරම්භ කර වසර 03 ක් ගතවී තිබුණද අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

### 6.2 විගණන කමිටු

-----------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව විගණන කමිටුවක් පත්කර නොතිබුණි.

### 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------------------

#### 6.3.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනයේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමත සීමා ඉක්මවීම් වලින් බැහැරවීම සඳහා එකම මිලදී ගැනීම අවස්ථා 8 කට වෙන්කර ප්‍රසම්පාදන සිදුකරමින් රු.මිලියන 5.5 ක්වූ මිලදී ගැනීම්වලදී රු.මිලියන 1.5 කින් සීමාව ඉක්මවා ප්‍රසම්පාදන තීරණ ලබාදී තිබුණි.

(ආ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ හෝ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව හා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු.11,142,000 ක් වූ කොන්ත්‍රාත් 03 ක් සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණි. එමෙන්ම ඒ සඳහා ගිවිසුම් අත්සන් නොකිරීම හේතුවෙන් එක් එක් ඉදිකිරීම් අවසන් කළයුතු කාලය නිශ්චිතව අනාවරණය කරගත නොහැකි විය.

(ඇ) 2016 සැප්තැම්බර් මාසයේදී මිල කැඳවීම් සිදුකර තිබුණු රු.6,179,821 ක් වූ ලී බඩු උපකරණ සහ රු.6,668,599 ක් වූ රසායනාගාර උපකරණ මිලදී ගැනීම 2017 ඔක්තෝබර් දක්වා ප්‍රමාදව සිදුව තිබුණි.

(ඈ) නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියෙන් ලබාදී තිබූ රු.2,300,000 ක්වූ ප්‍රතිපාදන මත ලී බඩු හා උපකරණ මිලදී ගැනීම් 03 ක් සඳහා රු.3,885,963 ක් වැය කිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවූ රු.1,585,963 ක් සම්බන්ධයෙන් අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### 6.4 අයවැය ලේඛනමය පාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ප්‍රකාරව ගිණුම් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර අයවැය ලේඛනය පිළියෙල කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර යුතු වුවත් අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 2016 දෙසැම්බර් 10 දිනදීය.

(ආ) වියදම් විෂයයන් 23 ක ඇස්තමේන්තුගත හා සත්‍ය වියදම් අතර සියයට 09 සිට සියයට 125 දක්වා විචලතාවයන් නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | • ජර්නල් සටහන් ලෙජර් ගිණුම්වලට සටහන් නොකිරීම හා ලෙජර ගිණුම් තුලනය කර නොතිබීම.<br>• ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබීම.<br>• ආදායම් වියදම් සඳහා වූ විෂයය අංක නිවැරදිව සටහන් නොකිරීම.<br>• ආරම්භක ශේෂ ඇතුළුව වර්ෂය තුලදී යොදන ලද ජර්නල් සටහන් 137 ක් වෙනුවෙන් අනුමැතිය ලබා නොගැනීම. |
| (ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය | පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | නියමිත කාලසීමාවන් තුල පාඨමාලා අවසන් නොකිරීම හා ප්‍රමාණවත් ප්‍රායෝගික පුහුණුවක් සිසුන්ට ලබාදීමට කටයුතු නොකිරීම. |